කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre.

2021 නොවැම්බර් මස 03 දින සඳහා කාලගුණ අනාවැකිය
2021 නොවැම්බර් මස 03 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

දිවයින ආශ්‍රිතව පැවති අඩු පීඩන කලාපය ක්‍රමයෙන් දිවයිනෙන් ඉවතට ගමන් කරමින් පවතී. කෙසේවෙතත් දිවයින ආශ්‍රිතව සවස් කාලයේ ගිගුරුම් සහිත වැසි ඇතිවීම සඳහා හිතකර වායුගෝලීය තත්ත්වයන් තවදුරටත් පවතී.

දිවයිනේ බොහෝ ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. බස්නාහිර, දකුණු සහ උතුරු පළාත්වල උදෑසන කාලයේදීද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

බස්නාහිර, සබරගමුව, වයඹ, මධ්‍යම සහ උතුරු-මැද පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට මි.මී 100 ට වැඩි තද වැසි ඇතිවිය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

WEATHER FORECAST FOR 03 NOVEMBER 2021
Issued at 05.30 a.m. on 03 November 2021

The low-pressure area located around Sri Lanka is moving away from the island. However atmospheric conditions are still favorable for the formation of evening thundershowers over the island.

Showers or thundershowers will occur at several places over most parts of the island during the evening or night. Showers or thundershowers may occur in the Western, Southern and Northern provinces during the morning too.

Heavy showers above 100 mm can be expected at some places in the Western, Sabaragamuwa, North-western, Central and North-central provinces and in Galle and Matara districts.

General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
2021 නොවැම්බර් මස 03 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

වැසි තත්ත්වය:

පුත්තලම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සුළඟ:

පුත්තලම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එන අතර දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සුළං නිරිත සිට ගිණිකොන දක්වා වන දිශා වලින් හමා එයි. සුළගේ වේගය පැ.කි.මී. (20-30) පමණ වේ.

පුත්තලම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-55) පමණ දක්වා වැඩි විය හැක.

මුහුදේ ස්වභාවය:

පුත්තලම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.
ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිළිබඳව අවධානයෙන් කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.
ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS

Issued at 05.30 a.m. on 03 November 2021

Condition of Rain:

Showers or thundershowers will occur at times in the sea areas extending from Puttalam to Potuvil via Colombo, Galle and Hambantota. Showers or thundershowers will occur at several places in the other sea areas around the island.

Winds:

Winds will be south-westerly in the sea areas extending from Puttalam to Potuvil via Colombo, Galle and Hambantota and winds will be south-westerly to south-easterly in other sea areas around the island. The wind speed will be (20-30) kmph in the sea areas around the island.

Wind speed can be increased up to **(50-55) kmph** at times in the sea areas extending from Puttalam to Potuvil via Colombo, Galle and Hambantota.

State of Sea:

The sea areas extending from Puttalam to Potuvil via Colombo, Galle and Hambantota will be rough at times.

Naval and fishing communities are requested to be vigilant in this regards.

Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි